# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
# ඇබෑර්තු

## භාණ්ඩ භාර ගැනීමේ සහායක

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2025 ජුනි මස 20 වැනි** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය)

**භාණ්ඩ භාරගැනීමේ සහායක තනතුර (පුරප්පාඩු මුළු තනතුරු සංඛ්‍යාව 04)**

1. **වැටුප් පරිමාණය -** 2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.42,290 - 9x490/10x540/6x590- 55,640 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.80,000/- පමණ වේ).

2. **වයස් සීමාව -** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

3. **අධ්‍යාපන සුදුසුකම් -**
සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයක් ද, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමර්ථ්‍යයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

4. **වෘත්තීය සුදුසුකම් -**
ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක මාස 05කට නොඅඩු මූලික සූපවේදී පාඨමාලාව / මූලික ආහාරපාන පාඨමාලාව හදාරා සහතිකයක් ලබා තිබීම ;
හෝ
සූපවේදී හෝ ආහාරපාන සේවා ක්ෂේත්‍රයේ NVQ II සහතිකයක් ලබා තිබීම.

5. **පළපුරුද්ද -**
ඉහත (3) සහ (4) හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, තරු පංතියේ හෝටලයක/ පිළිගත් ආයතනයක භාණ්ඩ භාරගැනීමේ සහායක/ මුළුතැන්ගෙයි සහායක/ භෝජනාගාර සහායක ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

6. **බඳවා ගැනීමේ ක්‍රමය -** ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**7. පරීක්ෂණ පටිපාටිය -**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් මගින් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

(අ) ප්‍රායෝගික පරීක්ෂණය

ප්‍රායෝගික පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් හදාරා ඇති පාඨමාලාවට අනුව, මුළුතැන්ගේ සහ ආහාර පාන යන කාණ්ඩ යටතේ අයදුම්කරුවන් පරීක්ෂා කර බලනු ලබන අතර, ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

(ආ) සම්මුඛ පරීක්ෂණය

ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලකුණු 40 කට ඉහළ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |

**8. සේවා නියමයන් හා කොන්දේසි:-**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

**9.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**10.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**11.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**12.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**13.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ, ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ, දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැ.බ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2025 මැයි මස 27 වැනි දින.